# ජාතික ඡායාරූප ශිල්පීන්ගේ සංගමය - ශ්‍රී ලංකාව (NAPSL)
## 30 වැනි සංවත්සර ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය සහ
## *ආධුනික ඡායාරූප ප්‍රදර්ශනය (දේශීය)*

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජාත්‍යන්තර ඡායාරූප ශිල්ප ආයතන 4 ක (FIAP,PSA,RPS & UPI) අනුග්‍රහය යටතේ පැවැත්වෙන ජාතික ඡායාරූප ශිල්පීන්ගේ සංගමයේ 30 වැනි සංවත්සර සමරු අන්තර්ජාතික ඡායාරූප ප්‍රදර්ශනයට සහ දේශීය ආධුනික ඡායාරූප ප්‍රදර්ශනයට කෘතීන් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඔබට ගෞරවයෙන් ආරාධනා කෙරේ...

**ඡායාරූප භාර ගන්නා අවසාන දිනය:** 2010 අගෝස්තු 15

**ඡායාරූප විනිශ්චිය:** 2010 අගෝස්තු 21

**ප්‍රදර්ශනය විවෘත කිරීම:** 2010 සැප්තැම්බර් මස 16 වැනි දින කොළඹ ජාතික කලා භවන

**තර- කොන්දේසි:**

**ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය:** ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයේ කොන්දේසි සහ අයදුම් පත්‍රය ඉංග්‍රීසි භාෂාවෙන් මේ සමඟ වෙනම ඇත.

**දේශීය ඡායාරූප ප්‍රදර්ශනය:**

- අංශ දෙකකින් පැවැත්වේ 1) **පාසැල් අංශය** 2) **පුහුණු ආයතන අංශය.** - සෑම අංශයක් සඳහාම වටිනා ත්‍යාග සහ පදක්කම් තුනක් ද සහතික පත්‍ර පහක් බැගින් ද පිරි නැමේ.
- ඕනෑම මාතෘකාවක් යටතේ වර්ණ හෝ කළු/සුදු (ඒක වර්ණ) ඡායාරූප උපරිම 5 ක් ඉදිරිපත් කල හැකිය. මාතෘකා උපරිම ඉංග්‍රීසි අකුරු 35කට හෝ සිංහල අකුරු 25කට සීමා විය යුතුය.
- ඡායාරූප පටල හෝ ඩිජිටල් සංවේදක මත සටහන් කරගන්නා ලද ඡායාරූප මුද්‍රණය කොට ඉදිරිපත් කල යුතු අතර එම ඡායාරූප පරිගණක මෘදුකාංග මඟින් අවශ්‍ය පරිදි සංස්කරණය කල හැකිය. (ආලෝක සමබරතාවය, පැහැ අන්තරය, සැකැස්ම ආදිය). නමුත් මේ සඳහා යොදාගන්නා සියළුම ඡායාරූප වල අයිතිය තර- කරු සතු විය යුතු අතර අන්තර්ජාලය හෝ එවැනි වෙනත් මූලාශ මඟින් ලබාගත් හිමිකම් රහිත ඡායාරූප කොටස් යොදා නොගත යුතුය.
- ඡායාරූපයක දිග පැත්ත අ- ල් 12 ත් 20ත් අතරද පළල පැත්ත අවම අ- ල් 10 ක්ද විය යුතු අතර **ලැමිනේට් කල ඡායාරූප භාරගනු නොලැබේ.** ඡායාරූප වල පිටුපස මාතෘකාව,අදාල අංකය, අංශය ශිල්පියාගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කල යුතුය.
- පුහුණු ආයතන අංශයට කෘතීන් ඉදිරිපත් කරනු ලබන ශිල්පීන් එම ආයතනයන්හි ඩිප්ලෝමාධාරීන් නොවිය යුතු අතර ඒ බැව් ආයතන ප්‍රධානියාගේ අත්සන සහ මුද්‍රාව සහිතව සනාථ කල යුතුය.
- එක් එක් අංශය සඳහා ඇතුල්වීමේ ගාස්තුව රු 250/- කි. නමුත් පාසැල් අංශය සඳහා පමණක් කණ්ඩායමක් වශයෙන් ඡායාරූප ඉදිරිපත් කරන්නේනම් (10 දෙනකුට නොඅඩු) එක් අයදුම් කරුවකු සඳහා ඇතුල්වීමේ ගාස්තුව රු 150/- ක් වේ.
- මුදල් ඇනවුම් හෝ චෙක්පත් මඟින් එවන මුදල් **"ජාතික ඡායාරූප ශිල්පීන්ගේ සංගමය"**(National Association of Photographers) නමට ලියා මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය **"දෙහිවල"** යනුවෙන් විය යුතුය. නැතහොත් ලංකා බැංකුවේ බම්බලපිටිය ශාඛාවේ ගිණුම් අංක 9780043 ට බැර වන ලෙස දිවයිනේ ඕනෑම බැංකු ශාඛාවකින් මුදල් ගෙවා මුල් පිටපත ඡායාරූප සම- එවිය හැක. ඡායාරූප **ජාතික ඡායාරූප ශිල්පීන්ගේ සංගමය, ආනන්දධර්මරාජ විහාර ගොඩනැගිල්ල, 2/1, ගාලු පාර, දෙහිවල** ලිපිනයට තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් දිය හැක.
- තරඟය සඳහා ඡායාරූප එවීමෙන් ඉහත තරඟ කොන්දෙසි වලට එකඟ වූ බැව් සැලකෙන අතර සංගමයේ ප්‍රචාරක කටයුතු සඳහා කෘතීන් යොදා ගැනීමේ සම්පූර්ණ අයිතිය සංගමය සතුවේ.

---------------------------------------------------(මෙතනින් වෙන්කරන්න)---------------------------------------------------

# ජාතික ඡායාරූප ශිල්පීන්ගේ සංගමය - ශ්‍රී ලංකාව (NAPSL)
## 30 වැනි සංවත්සර ආධුනික ඡායාරූප ප්‍රදර්ශනය (දේශීය)

### <u>අයදුම් පත්‍රය</u>

| අංකය | මාතෘකාව/Title (ඉංග්‍රීසි අකුරු 35කට හෝ සිංහල අකුරු 25කට සීමා විය යුතුය) | Acceptance/ Awards |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

නම: ................................................................................ නම ඉංග්‍රීසියෙන් (Name in English)......................................................

ලිපිනය: ..................................................................................................................................................................

දුරකථන අංක: ........................................ විද්‍යුත් තැපෑල: (e-mail)..................................................................

30වැනි සාංවත්සරික ඡායාරූප ප්‍රදර්ශනයේ දේශීය ආධුනික අංශය සඳහා මවිසින් ඉහත සඳහන් ඡායාරූප ඉදිරිපත් කරන අතර ප්‍රදර්ශනයේ නීති රීති වලටද එකඟ වෙමි. ඇතුල්වීමේ ගාස්තු වශයෙන් රු................ ක මුදලක් / චෙක්පතක්/ මුදල් ඇනවුමක් (අංකය.........................) / ලංකා බැංකු ගිණුමට මුදල් ගෙවූ රිසිට්පතේ මුල් පිටපත මේ සමඟ එවමි.

.................................. ..................................

අත්සන දිනය

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

ඉහත නම සඳහන් අය ......................................................... විද්‍යාලයේ / ආයතනයේ ආධුනික පාඨමාලාවක් හදාරන ශිෂ්‍යයෙකු / ශිෂ්‍යාවක බැව් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ නම: ................................................................... තනතුර: ..............................................................

.................................. ..............................

අත්සන නිල මුද්‍රාව: දිනය